(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(5).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2023 අගෝස්තු 29 අඟහරුවාදා

---

**2023 සැප්තැම්බර් 08 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා.53/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය ප්‍රකාශයට පත්කිරීම,— කඳුරට වතුකර කම්කරුවන් ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ එහි ආර්ථිකය වෙනුවෙන් සුවිශාල දායකත්වයක් ලබාදුන් ප්‍රජාවක් වන හෙයින් ද, ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ තම අයිතිවාසිකම් දිනා ගනිමින් එම අරගලයන් හි දී සිය ජීවිත පූජා කළ වෘත්තීය සමිති විරුවන් එක් පොදු දිනක දී සිහිපත් කිරීම මෙරට ජීවත්වන ඉන්දීය සම්භවයක් සහිත කඳුරට ජනතාවගේ දීර්ඝකාලීන ඉල්ලීමක් වන හෙයින් ද, 1939 දෙසැම්බර් සිට 1940 ජනවාරි දක්වා ශ්‍රී ලංකාවේ කඳුරට කම්කරු ප්‍රජාව විසින් වැටුප් වැඩි කරන මෙන් ඉල්ලා සිදු කරන ලද ප්‍රථම වෘත්තීය සමිති අරගලයේ දී සුදු ජාතිකයෙකු විසින් සිදුකරන ලද වෙඩි තැබීමකින් “මුල්ලෝයා ගෝවින්දන්” නමැති කම්කරුවා ජීවිතක්ෂයට පත් වූ හෙයින් ද, කඳුරට කම්කරු ප්‍රජාව විසින් සිදුකරන ලද අවිහිංසාවාදී අරගලයේ දී ජීවිතය පූජා කළ එම පළමු කම්කරුවා සහ ඉන් අනතුරුව කඳුරට කම්කරු ජනතා අයිතිවාසිකම් සහ සුභසාධනය සඳහා දියත් කෙරුණු බොහෝ වෘත්තීය සමිති අරගලයන් හි දී ජීවිත පූජා කළ අනෙකුත් විරුවන් සැමරීම සඳහා එම පළමු වෘත්තීය සමිති විරුවා මියගිය දිනය වන ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/2023

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— 1798 වර්ෂයේදී ආරම්භ කරන ලදුව 1882 වර්ෂයේදී ඉංග්‍රීසීන් විසින් විධිමත් කරන ලද වසර දෙසීයකට අධික ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකා තැපැල් සේවය අප රට තුළ නිදහසින් පසුව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන රජය විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවක් වන හෙයින් ද, කඳුරට වතුකර ජනතාව මෙරට පදිංචි වී වසර දෙසීයක පමණ කාලයක් ගත වී ඇතත් ඔවුන් පදිංචි නිවාස වෙත සෘජුව ලිපි රැගෙන ගොස් භාර දීමක් සිදු නොවන හෙයින් එම ජනතාව විවිධ අපහසුතාවන්ට පත් වී සිටින හෙයින් ද, අවුරුදු දෙසීයක කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන මෙම ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

---

**2023 සැප්තැම්බර් 19 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1509/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මයිටා උවදුර, ශ්‍රී ලංකාවේ පොල් වගාවට හානි සිදු කරනු ලබන බවත්;

(ii) ඒ හේතුවෙන් පොල් ඵලදාව ඉතා අඩු වන බව සහ පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත් වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මයිටා උවදුර මර්දනය කිරීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) ශ්‍රී ලංකාවට විශාල විදේශ විනිමයක් උපයා දෙනු ලබන පොල් වගාව ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන කෙටිකාලීන හා දිගුකාලීන ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1547/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුවේ වාර්ෂික ආදායම සහ වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දෙපාර්තමේන්තුවේ වැටුප් හා දීමනා වෙනුවෙන් වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

(iii) දෙපාර්තමේන්තුවේ සේවකයන්ට ගෙවනු ලබන දීමනා වර්ග කවරේද;

(iv) විදේශ තැපැල් සේවාවන් සැපයීමෙන් දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව උපයනු ලබන ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1582/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ පළමුවරට ලියාපදිංචි කරන ලද නව යතුරුපැදි සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් සිලින්ඩර් ධාරිතාවය යටතේ ලියාපදිංචි කර ඇති යතුරුපැදි සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් යතුරුපැදි නිෂ්පාදනය කර ඇති රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1618/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2020 වර්ෂයේදී පරිසර අමාත්‍යාංශය විසින් අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ඒ යටතේ වගකීම් පැවරෙන ආයතන හඳුනාගෙන ඇති බවත්;

(ii) එසේ වුවද, 2022 වර්ෂය වන තෙක් එයට අදාළ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් මේ වනවිට සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාකාරී සැලස්ම කවරේද;

(iii) නොඑසේ නම්, එය සකස් කරනු ලබන දිනය කවරේද;

(iv) ඉහත ප්‍රතිපත්තිය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී ඇති විය හැකි ගැටලු හඳුනාගෙන තිබේද;

(v) එසේ නම්, එම ගැටලු විසඳා ගැනීම සඳහා සකස් කර ඇති ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1640/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෑස් හිඟ වීම සහ ගෑස් මිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් විකල්ප බලශක්ති භාවිතා කිරීම සඳහා නව නිපැයුම් විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද බව දන්නේද;

(ii) එම නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමෙන් ගෑස් ආනයනය කිරීම සඳහා වැය වන විදේශ විනිමය ඉතිරි කර ගත හැකි බව දන්නේද;

(iii) එම නව නිපැයුම් නිර්මාණකරුවන් සහ ඒවා භාවිතා කරනු ලබන පාරිභෝගිකයන් දිරිගැන්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1680/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී ආරම්භ කරන ලද වවුනියාව විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල පුරප්පාඩු හා භෞතික සම්පත් හිඟයක් පවතින බව දන්නේද;

(ii) එම පුරප්පාඩු පිරවීමට සහ හිඟ භෞතික සම්පත් ලබාදීමට පියවර ගන්නේද;

(iii) වවුනියා විශ්වවිද්‍යාලයේ පීඨවලට අදාළ මණ්ඩප, මුලතිව් සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1760/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයෙන් පසු දේශපාලන පළිගැනීම්වලට ලක් වූ මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවකයන් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම විමර්ශන අනුව මේ වනවිට සහන ලබා දී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනතෙක් සහන ලබා දී නොමැති සේවකයන්ට ඉදිරියේදී සහන ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1800/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ ඇති විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම දිස්ත්‍රික්කයේ ඇති සමූපකාර ප්‍රාදේශීය වෙළෙඳසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රාදේශීය වෙළෙඳසැල්වල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වෙළෙඳසැල් සඳහා අවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය සීමාසහිත ලංකා සතොස ආයතනය විසින් සපයනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1811/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) "එක්ස්ප්‍රස් පර්ල්" නෞකාවේ අනතුර හේතුවෙන් විශාල පරිසර හානියක් සිදු වූ බව පිළිගන්නේද;

(ii) එම පරිසර හානිය ගණනය කිරීමේ හා ඒ සම්බන්ධයෙන් වන්දි ලබා දීමේ ක්‍රියාවලියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2533/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, මූතූර් මූලික රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව;

(ii) එම රෝහලේ සේවය කරනු ලබන වෛද්‍යවරු හා හෙදියන් සංඛ්‍යාව ඔවුන්ගේ සන්නිවේදන භාෂාව අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත රෝහලේ මේ වනවිට පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 සැප්තැම්බර් 20 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2577/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් ඒ සඳහා භාවිතා කරනු ලබන ජලාශ කවරේද;

(iii) වර්ෂ 2019 සිට මේ දක්වා එම ධීවරයන් වෙනුවෙන් ලබා දී ඇති පහසුකම් කවරේද;

(iv) ඉහත සඳහන් ධීවරයන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2621/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මුල්‍ය, දේපොළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිවයුතු නිලධාරින් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිවයුතු නිලධාරින් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදුවිය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2693/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය, අතුරු ආබාධ රහිත, බොහෝ රෝග සුව කිරීමට හැකියාවක් ඇති වෛද්‍ය ක්‍රමයක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රචලිත වී ඇති බවත්;

(ii) වෛද්‍ය ප්‍රතිකාරවල නියැලී සිටින දක්ෂ හෝමියෝපති වෛද්‍යවරුන්ට වර්ෂ ගණනාවක සිට ලියාපදිංචිය ලබා දී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) වර්ෂ ගණනාවක සිට ලියාපදිංචිය අපේක්ෂාවෙන් සිටින හෝමියෝපති වෛද්‍යවරුන්ට ලියාපදිංචිය ලබාදීම සඳහා සකස් කරඇති වැඩපිළිවෙළ කවරේද;

(ii) ප්‍රායෝගික පරීක්ෂණයක් තුළින් එම වෛද්‍යවරුන්ගේ දැනුම පරීක්ෂා කර ඔවුන්ට ලියාපදිංචිය ලබා දිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය දියුණු කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) හෝමියෝපති වෛද්‍ය ප්‍රතිකාර සඳහා අවශ්‍ය ඖෂධ ආනයනය කිරීමට විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

(iii) හෝමියෝපති විශ්වවිද්‍යාලය නැවත ආරම්භ කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2846/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නව වාහනයක් පළමු ලියාපදිංචි කිරීම මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ නාරාහේන්පිට ප්‍රධාන කාර්යාලයෙන් පමණක් සිදු කරන්නේද;

(ii) නොඑසේනම්, පළමු ලියාපදිංචි කිරීම සිදු කළ හැකි මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වාර්ෂිකව හිමිකම් පැවරීම සිදු කරනු ලබන වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) වාහන හිමිකම් පැවරීමේ එක්දින සේවය සහ සාමාන්‍ය සේවය සඳහා අය කරන ගාස්තුව එක් එක් වාහන පංතිය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2934/2023

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාව අනුව එම ප්‍රහාරය සම්බන්ධයෙන් චෝදනා එල්ල වී ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) චෝදනා එල්ල වී ඇති ඉහත එක් එක් පොලිස් නිලධාරියාගේ නම, පාස්කු ප්‍රහාරය සිදු කරනු ලබන අවස්ථාව වනවිට දැරූ තනතුර හා රාජකාරි ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරීන් අතරින් මේ වනවිට සේවයේ නිරතව සිටින එක් එක් නිලධාරියාගේ නම හා සේවා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම නිලධාරීන් අතරින් සමහර නිලධාරීන් ශ්‍රී ලංකා පොලිසියේ ඉහළ තනතුරුවල සේවය කිරීම හේතුවෙන් පාස්කු ප්‍රහාරය සම්බන්ධ පරීක්ෂණ අඩාල කිරීමට හෝ පරීක්ෂණ වාර්තා වෙනස් කිරීමට හැකියාවක් තිබෙන බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2972/2023

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනාරක්ෂිත අයුරින් පාසල් සිසුන් මාර්ග ධාවන තරඟවලට සහභාගී කරවනු ලබන බව දන්නේද;

(ii) දැඩි රථවාහන තදබදයක් පවතින අවස්ථාවලදී ප්‍රධාන නගර ආශ්‍රිතව එවැනි මාර්ග ධාවන තරඟ පැවැත්වීමට පාසල් වෙත අවසර ලබා දී තිබේද;

(iii) එසේ නම්, එම අවසර ලබා ගනු ලබන පාසල්/ආයතන විසින් මාර්ග ධාවන තරඟවලට සහභාගී වන සිසුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ප්‍රධාන නගරවලින් ඈත්ව රථවාහන තදබදය අඩු මාර්ග පමණක් භාවිතා කර මාර්ග ධාවන තරඟ පැවැත්වීම සුදුසු බව පිළිගන්නේද;

(v) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පාසල් වෙත නිකුත් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3074/2023

ගරු අශෝක් අබේසිංහ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ —

(i) සේවය කරනු ලබන මුළු සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ස්ථිර සහ කොන්ත්‍රාත්/අනියම් පදනම මත සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොන්ත්‍රාත්/අනියම් පදනම මත මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් ස්ථිර කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3096/2023

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා තේ මණ්ඩලය සඳහා පළිබෝධ නාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රයක් මිලදී ගන්නා ලද දිනය කවරේද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) එම යන්ත්‍රය මේ වනතෙක් භාවිතයට ගෙන නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, ඊට හේතු කවරේද;

(v) මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3108/2023

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය, නෙඩුන්තීවු දූපතේ මේ වනවිට සිටින ගවයින් සංඛ්‍යාව කොපමණද;

(ii) නෙඩුන්තීවු දූපතෙහි පශු සම්පත් ගහනය එක් එක් සත්ව වර්ගය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සතුන්ගේ ආහාර හා ජල අවශ්‍යතා සපුරාලනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නෙඩුන්තීවු දූපතෙහි සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලයක් ස්ථාපිතකර තිබේද;

(ii) නෙඩුන්තීවු දූපත සඳහා ස්ථිර පශු වෛද්‍යවරයෙක් පත් කර තිබේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

(iv) එම දූපත සඳහා ස්ථිර පශු වෛද්‍යවරයෙකු පත් කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3232/2023

ගරු නිරෝෂන් පෙරේරා මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීගමුව-කුලියාපිටිය මාර්ගයේ, තුම්මෝදර නව පාලම ඉදිකිරීම සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදනය කොපමණද;

(ii) එම පාලමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම ඉදිකිරීම් කටයුතු අවසන් කළ යුතු දිනය කවරේද;

(iv) එම පාලම ඉදිකරනු ලබන කොන්ත්‍රාත් සමාගම කවරේද;

(v) මේ වනවිට එම කොන්ත්‍රාත් සමාගමට ගෙවා ඇති මුදල කොපමණද;

(vi) තුම්මෝදර නව පාලමේ ඉදිකිරීම් කටයුතු කඩිනමින් අවසන් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 සැප්තැම්බර් 21 බ්‍රහස්පතින්දා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ අටවැනි විධායක ජනාධිපතිවරයාට මේ වනවිට සිටින උපදේශකවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම එක් එක් උපදේශකවරයා විසින් උපදෙස් දෙනු ලබන විෂය ක්ෂේත්‍රය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයාට ගෙවනු ලබන වැටුප් හා වෙනත් දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත සඳහන් උපදේශකවරුන් පත්කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය හා සලකා බලන ලද නිර්ණායක වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

388/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර ජාතික රෝහලේ මිනිස් අවයව සම්බන්ධ ජාවාරමක් සිදු කරනු ලබන බව 2022.01.27 දින "ලක්සර" සමාජ මාධ්‍ය ප්‍රකාශය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ලිපියකින් චෝදනා එල්ල කර ඇති බවත්;

(ii) ඉහත ජාවාරම සම්බන්ධයෙන් පුළුල් විමර්ශනයක් සිදු කරන මෙන් මහනුවර ජාතික රෝහලේ විශේෂඥ වෛද්‍යවරුන් කණ්ඩායමක් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) "මියගිය දායකයන්ගේ අවයව පරිත්‍යාග කිරීමේ ජාතික වැඩසටහනේ" නුවර කලාපයේ ප්‍රධාන මෙහෙයුම් භාර නිලධාරි විසින් මේ සම්බන්ධයෙන් එම රෝහල් අධ්‍යක්ෂවරයාට දැනුම් දී ඇති බවට තොරතුරු තිබේද;

(ii) මෙවැනි චෝදනාවක් එල්ලවීමෙන් මහනුවර ජාතික රෝහල සම්බන්ධයෙන් ජනතාව අතර වැරදි සහගත ආකල්පයක් ඇතිවීම හා රෝහල් පද්ධතිය සම්බන්ධයෙන් විශ්වාසය බිඳී යාම වළක්වා ගැනීම සඳහා පියවර ගන්නේද;

(iii) චෝදනාව පදනම් විරහිත නම්, ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

424/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වාර්ෂික ආහාරමය පොල්තෙල් පරිභෝජනය;

(ii) එම ප්‍රමාණයෙන් දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන ප්‍රමාණය;

(iii) ආනයනය කරනු ලබන පොල්තෙල් ප්‍රමාණය;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේශීය පොල්තෙල් නිෂ්පාදකයන් අතරින් මේ වනවිට ලියාපදිංචි නිෂ්පාදකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ලියාපදිංචි නොවූ පොල්තෙල් නිෂ්පාදකයන් සිටින බව දන්නේද;

(iii) ඔවුන් විසින් නිෂ්පාදනය කරනු ලබන පොල්තෙල් වෙළඳපොළට නිකුත් කරනු ලබන බව පිළිගන්නේද;

(iv) ප්‍රමිතියට අනුකූල නොවන පොල්තෙල් නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදකයන්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

437/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගොන්ගල, හේස්වත්ත ආසන්නයේ ගිං ගඟේ ජල පෝෂක ප්‍රදේශය යන්ත්‍ර සූත්‍ර යොදා එළිපෙහෙළි කරන බවත්;

(ii) ගොන්ගල මුදුනට විශාල මාර්ගයක් සකස් කර ඇති බවත්;

(iii) මේ හේතුවෙන් ඉදිරියේදී නායයෑම් ඇති විය හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිසර විනාශය වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගොන්ගල පරිසර පද්ධතියේ ඉඩම් හෙක්ටයාර් දෙදහස් පන්සියයක් සිංහරාජ වනාන්තරයට එක් කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද ගැසට් පත්‍රය ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

(ii) ගොන්ගල පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3351/2023

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පළාත් සභා පාලනය යටතේ පවතින රජයේ රෝහල් හා සෞඛ්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් රෝහලේ හා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ නම සහ පිහිටුවා ඇති පළාත හා දිස්ත්‍රික්කය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් රෝහල් සිටිය යුතු හා මේ වනවිට සිටින වෛද්‍යවරුන් සහ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් රෝහල්වල පවතින වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩිදුර අධ්‍යාපනය සඳහා 2015 වර්ෂයෙන් පසු විදේශ ගත වූ වෛද්‍යවරුන් නැවත ශ්‍රී ලංකාවට නොපැමිණ තිබේද;

(ii) එසේ නම්, එම වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3358/2023

ගරු ජයන්ත සමරවීර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කර ඇති අත්‍යාවශ්‍ය බටහිර ඖෂධ සංඛ්‍යාව කොපමණද;

(ii) එවායේ ඖෂධ නාමයන් කවරේද;

(iii) එම එක් එක් ඖෂධය නිෂ්පාදනය කරනු ලබන රට, නිෂ්පාදනය කරනු ලබන සමාගම/ආයතනය සහ ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සමාගම/ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් ආනයනය කරනු ලබන ඖෂධ සංඛ්‍යාව සහ ඒවායේ ඖෂධ නාමයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉහත (iv)හි සඳහන් සංඛ්‍යාව, මුළු අත්‍යාවශ්‍ය ඖෂධ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෑතකාලයේ ඇමරිකානු ඩොලරයේ අගය ඉහළ යාමේ ප්‍රතිශතයට වඩා වැඩි ප්‍රතිශතයකින් ඖෂධවල මිල ඉහළ ගිය බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඊට හේතු කවරේද;

(iii) ඖෂධවල මිල ඉහළ යාම පාලනය කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3409/2023

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 668 අළුත්ගම ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කිලෝමීටර් 1.5ක් පමණ වන "ගම්මාන පාර", ග්‍රාමීය මාර්ග ලක්ෂයක් කාපට් කිරීමේ වැඩසටහන යටතේ කාපට් අතුරා සංවර්ධනය කිරීම සඳහා වැඩ ආරම්භ කරන ලද නමුත් මීට මාස 6කට පමණ පෙර සංවර්ධන කටයුතු අතරමග නවතා ඇති බවත්;

(ii) මාර්ගයේ තිබූ තාර හා කොන්ක්‍රීට් කොටස් ගලවා තැනින් තැන ABC තට්ටුවක් පමණක් දමන ලද අතර වර්ෂාව හේතුවෙන් එම ABC තට්ටුවද සෝදා ගොස් මේ වනවිට එම මාර්ගයේ ගමන් කිරීමට පවා නොහැකි අන්දමට අබලන් වී ඇති බවත්;

(iii) කාපට් අතුරන තෙක් තාවකාලික පිළියමක් ලෙස එම මාර්ගය සඳහා තාර තට්ටුවක් දැමීමට කළුතර, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ඇස්තමේන්තුවක් යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඒ අනුව, තාවකාලික තාර ස්ථරයක් යොදා ඉහත මාර්ගය කඩිනමින් පිළිසකර කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3484/2023

ගරු වේලු කුමාර් මහතා,— ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පාත හේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි පවුල් අතරින් පානීය නල ජල පහසුකම් සහිත පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පවතින පානීය ජල ගැටලුව විසඳීම සඳහා ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3570/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමෙන් පසු රජයේ සේවකයන්ට අදාළ මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කිරීමට මාස දහයකට අධික කාලයක් ප්‍රමාද වන බවත්;

(ii) එම ප්‍රමාදය හේතුවෙන් සමහර රජයේ සේවකයන් සිය ප්‍රථම විශ්‍රාම වැටුප ලැබීමට පෙර මිය යන බවත්;

(iii) එම ප්‍රමාදය රජයේ සේවකයන්ට කරනු ලබන දැඩි අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රමාදයට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3596/2023

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපති ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන විශේෂ ව්‍යාපෘති ඒකකය විසින් 2022 .07.14 දින සිට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

(ii) එම ඒකකයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, තනතුර, වැටුප් හා දීමනා සහ ලබා දී ඇති වාහන සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ඒකකයේ සේවය කරනු ලබන සමස්ථ කාර්යය මණ්ඩලයම දේශපාලන පක්ෂයක පූර්ණකාලීකයන් ලෙස කටයුතු කරන බව දන්නේද;

(v) එම ඒකකය නඩත්තු කිරීම සඳහා මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 සැප්තැම්බර් 22 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

692/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් කාර්යාලය ස්ථාපිත කර ඇති ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් කාර්යාලයේ සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත කාර්යාල අතරින් කුලී පදනම මත ලබා ගෙන ඇති ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන කාර්යාල කවරේද;

(v) එම කාර්යාල සඳහා ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

819/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වාමියා මිය යාම/අතහැර යාම හා වෙනත් හේතූන් මත ශ්‍රී ලංකාවේ සැළකිය යුතු කාන්තාවන් පිරිසක් සිය පවුල් ඒකකයේ ගෘහමූලිකයා බවට පත් වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, සිය පවුල් ඒකකයේ ගෘහමූලිකයා ලෙස කටයුතු කරනු ලබන කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාන්තාවන්ට සහන සැලසීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) ස්වාමියා මියයෑම / අතහැර යෑම හා වෙනත් හේතූන් මත අසරණ තත්ත්වයකට පත් වී ඇති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මියයාම/අතහැර යාම හා වෙනත් හේතූන් මත සිය භාර්යාව නොමැතිව ස්වාමියා විසින් දරුවන් රැකබලා ගනු ලබන පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් ඒකකවලට සහන සැලසීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

840/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2022 දක්වා එක් එක් වර්ෂයේ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පොල්තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(iii) පොල්තෙල් ආනයනය කරන ලද රටවල් සහ සමාගම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

854/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග කිලෝ මීටර් 100,000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංවර්ධන කටයුතු ආරම්භ කරන ලද මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ගවල නම් කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය යටතේ මේ වනවිට සංවර්ධන කටයුතු අවසන් කර ඇති මාර්ගවල දිග සහ සංවර්ධන කටයුතු අවසන් කර නොමැති මාර්ගවල දිග වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත ව්‍යාපෘතිය යටතේ මාර්ග සංවර්ධන කටයුතු සිදු කරන ලද කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවන ලද මුදල සහ ගෙවීමට තිබෙන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2023

ගරු රෝහණ බංඩාර මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1317/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කාති උසාවි සංඛ්‍යාව කොපමණද;

(ii) කාති උසාවි මඟින් ලබා දෙන ලද තීන්දු අනුව වර්ෂ 2015 සිට මේ දක්වා සිදු වී ඇති දික්කසාද සංඛ්‍යාව කොපමණද;

(iii) කාති උසාවිවල සේවය කරන වයස අවුරුදු 60 ඉක්මවූ කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) උපාධි සුදුසුකම් සහිත කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) කාතිවරුන් තෝරාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1718/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මෙරටට ලැබුණු විදේශ ප්‍රේෂණවල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වටිනාකම, සමස්ථ විදේශ විනිමය ඉපයීම්වල ප්‍රතිශතයක් ලෙස ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීත්‍යානුකූල ක්‍රමවේද ඔස්සේ ශ්‍රී ලංකාවට විදේශ මුදල් ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2020/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ මහපොළ අභ්‍යාස ආයතනය (මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය) ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ආයතනය විසින් මේ වනවිට පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් පාඨමාලාව කවරේද;

(iv) එම ආයතනය ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනයට යොදා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2552/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2022.12.31 වැනි දිනට විශ්‍රාම ගන්වන ලද රජයේ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) විශාල ගුරුවරුන් සංඛ්‍යාවක් එකවර විශ්‍රාම ගැන්වීම හේතුවෙන් රජයේ පාසල් පද්ධතිය අකර්මණ්‍ය වීමේ අවදානමක් තිබේද;

(iii) ඉහත විශ්‍රාම ගැන්වීම හේතුවෙන් ඇති වූ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ අතුරු අයවැයෙන් පශු සම්පත් සංවර්ධනය සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(ii) එයින් භාවිතා කරන ලද සහ භාවිතා නොකරන ලද ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ කුකුළු මස් නිෂ්පාදනය සහ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?